# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
## (සංශෝධන)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2025 දෙසැම්බර් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 නොවැම්බර් මස 28 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[**41** වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 87.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය***: මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් අයදුම්කරුවකුට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරන තෙක්, ඒ අයදුම්කරු විසින් කොමිෂන් සභාව වෙත ඇතැම් ගාස්තු ගෙවීම අවශ්‍ය නොවන බවට විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බලයලත් තැනැත්තකුගේ සේවානියුක්තයකුගේ සේවානියුක්ති ආදායමට අදාළව ප්‍රදානය කරනු ලබන ආදායම් බදු නිදහස් කිරීම නතර කිරීම වේ.

***4 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන අදාළ කර ගැනීම වේ.

***5 වන වගන්තිය***: මේ වගන්තිය මගින් පැහැදිලි කිරීමේ කාර්ය සඳහා ඇතැම් පාඨවල වැරදි නිවැරදි කිරීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***6 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 42අ, 42ආ, 42ඇ, 42ඈ, 42ඉ සහ 42ඊ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් වගන්තිවල නීතිය බලපෑම වනුයේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බලපත්‍රලාභී බලයලත් තැනැත්තන් මහ බැංකුව විසින් ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් මහ බැංකුවේ නිර්දේශය මත අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***9 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රලාභී බලයලත් තැනැත්තකු විසින් සිදු කරනු ලැබිය හැකි ව්‍යාපාර වර්ග පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ඒ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රලාභී තැනැත්තකුගේ ගිණුම් විගණනය කිරීමට අදාළ විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***12 වන වගන්තිය***: මේ වගන්තිය මගින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවලට ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ නොවන බවට විධිවිධාන සැලැස්වීම පිණිස ප්‍රධාන ප්‍රඥප්තියට 51අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.

***13 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර හඳුනාගැනීම සඳහා වන නිර්ණායක නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***14 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 52අ, 52ආ, 52ඇ, 52ඈ සහ 52ඉ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ අලුත් වගන්තිවල නීතිය බලපෑම වනුයේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල කාර්යසාධනය ඇගයීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***15 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 13 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***16 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 8 වන සහ 13 වන වගන්ති මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***17 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

## කොළඹ වරාය නගරය
## ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන)

එල්.ඩී.-ඕ 47/2025

### 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2025 අංක         දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2021 අංක 11 දරන පනතේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම**

**2.** (මේ පනතේ “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 27 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> “(2අ) ඉල්ලුම්කරුවකුට 26 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන යටතේ නියම කරනු ලැබ ඇති පරිදි බලපත්‍රයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර ඇත්නම් මිස, කොමිෂන් සභාව විසින්, ඒ ඉල්ලුම්කරුගෙන් (2) වන උපවගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති ගාස්තුව හැර, ඉඩම් පරිහරණය කිරීමේ ගාස්තුවක් ද ඇතුළුව, වෙනත් යම් ගාස්තුවක් අය නොකළ යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

> **“වාසික හෝ නිර්වාසික තැනැත්තකු සේවයේ යෙදවීමට බලයලත් තැනැත්තකුට අවසර ඇති බව**
>
> **35.** (1) කොමිෂන් සභාව විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට මේ වගන්තිය ආරම්භ වන දිනයට පෙරාතුව ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් නිකුත් කරනු ලැබ ඇති හෝ ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තකු විසින් යම් වාසික හෝ නිර්වාසික තැනැත්තකු සේවයේ නියුක්ත කළ හැකි අතර, ඒ

PL 15572 - 475 (2025/12)

සේවානියුක්තයාට ශ්‍රී ලංකා රුපියල් නොවන නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ වගන්තිය ක්‍රියාත්මක වන මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ සිට ආරම්භ වන අවුරුදු තුනක කාලසීමාවක් සඳහා -

(අ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කරන ලද වාසික සේවානියුක්තයකුගේ සේවානියුක්ති ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, එය ඒ වාසික සේවානියුක්තයාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීමට අවසර ඇති සේ සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් සේවයේ නියුක්ත කරන ලද නිර්වාසික සේවානියුක්තයකුගේ සේවානියුක්ති ආදායම ආදායම් බද්දෙන් නිදහස් විය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, ඒ නිර්වාසික සේවානියුක්තයා ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයාගත් යම් ආදායමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ දී ආදායම් බද්දට යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තිය ක්‍රියාත්මක වන දින හෝ එදිනට පසුව කොමිෂන් සභාව විසින් ලියාපදිංචි කිරීමක්, බලපත්‍රයක්, බලය ලබාදීමක් හෝ වෙනත් අනුමතයක් නිකුත් කරනු ලැබ ඇති හෝ ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තකුගේ වාසික සේවානියුක්තයකුගේ සහ නිර්වාසික සේවානියුක්තයකුගේ සේවානියුක්ති ආදායම ආදායම් බද්දට යටත් විය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ "නියම කරනු ලැබිය යුතු ආකාරයට සහ නියම කරනු ලැබිය යුතු යම් කොන්දේසිවලට යටත්ව, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට" යන වචන වෙනුවට "2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නියම කරනු ලැබිය හැකි නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) බැංකු පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) වෙනත් රටක සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද සහ යම් නීතියක්, අධිකාර පත්‍රයක්, ව්‍යවස්ථාවක්, සාංගමික ව්‍යවස්ථාවලියක් හෝ ඒ රට තුළ ඒ සංස්ථාගත කිරීම හෝ පිහිටුවීම සහ බලය දීම සංයුක්ත කරන හෝ අර්ථ නිරූපණය කරන වෙනත් යම් සාධන පත්‍රයක් යටතේ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලය දෙනු ලැබ ඇති සහ කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අදහස් කරන සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක්, මේ පනත ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බලප්‍රදේශය තුළ සහ

එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.''; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''බැංකු පනත යටතේ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස'' යන වචන වෙනුවට ''මේ පනත යටතේ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කරන ලෙස'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියට 42අ, 42ආ, 42ඇ, 42ඈ, 42ඉ සහ 42ඊ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 42අ, 42ආ, 42ඇ, 42ඈ, 42ඉ සහ 42ඊ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය.:-

''ජාත්‍යන්තර බැංකුකරණ ප්‍රමිති අදාළ කර ගැනීම

**42අ.** (1) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම මහ බැංකුව විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකුට, කලින් කල සම්මත කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් නියමයක්, විධානයක් හෝ තීරණයක් නිකුත් කිරීමේ අධිකාරී බලය මහ බැංකුව වෙත තිබිය යුතු ය.

(3) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින් (2) වන උපවගන්තියේ සඳහන් නියමයට, විධානයට හෝ තීරණයට අනුකූලව කටයුතු කළ යුතු ය.

(4) (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ජාත්‍යන්තර ප්‍රමිතිවලට, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලතාවය, අවදානම් කළමනාකරණය, අධීක්ෂණ සමාලෝචනය සහ වෙළෙඳපොළ විනය හා සම්බන්ධ අවශ්‍යතා ඇතුළත් විය යුතු නමුත් ඊට සීමා නොවිය යුතු ය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මක-තාවය පිළිබඳ අවශ්‍යතා

**42ආ.** මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, කලින් කල සම්මත කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි අවම ප්‍රාග්ධන අවශ්‍යතාව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ තෝලන අනුපාතය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

අවදානම් කළමනාකරණය හා අධීක්ෂණ සමාලෝචනය

**42ඇ.** මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, ණය අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළෙඳපොළ අවදානම ද ඇතුළුව, එහෙත් ඊට සීමා නොවන්නා වූ, අවදානම් හඳුනා ගැනීම, මැන බැලීම, අධීක්ෂණය කිරීම සහ අවම කිරීම පිණිස තිරසර අවදානම් කළමනාකරණ රාමුවක්, කලින් කල සම්මත කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව පිහිටුවීම සහ පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

ද්‍රවශීලතා අවශ්‍යතා

**42ඈ.** මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, කලින් කල සම්මත කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව මහ බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ද්‍රවශීලතා අවශ්‍යතා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

හෙළිදරව් කිරීම සහ විනිවිදභාවය

**42ඉ.** (1) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, කලින් කල සම්මත කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, ස්වකීය මූල්‍ය තත්ත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ද්‍රවශීලතාවය ද ඇතුළුව එහෙත් ඊට සීමා නොවන්නා වූ කාරණා පිළිබඳ ව කාලීනව මහජනතාව වෙත තොරතුරු හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(2) ඒ හෙළිදරව් කිරීම මහ බැංකුව විසින් විධාන මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් විය යුතු ය.

විධාන, මාර්ගෝපදේශ සහ විචක්ෂණශීලී ප්‍රමිති

**42ඊ.** මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු-

(අ) මේ පනතේ යම් විධිවිධානයකට හෝ ඒ යටතේ පනවන ලද යම් නියාමන අවශ්‍යතාවයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී;

(ආ) යම් වංචනික, අනාරක්ෂිත හෝ නුසුදුසු බැංකුකරණ පරිචවල යෙදී සිටින අවස්ථාවක දී; හෝ

(ඇ) මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීමෙහිලා අගතිදායක වන ආකාරයකින් ස්වකීය මෙහෙයුම් කටයුතු සිදු කර ගෙන යනු ලබන බව මහ බැංකුවේ අදහස වන අවස්ථාවක දී,

මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිවැරදි කිරීමේ පියවර ගන්නා ලෙස ඒ තැනැත්තාට නියම කිරීම හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි දණ්ඩන සහ සීමා කිරීම් පැනවීම මහ බැංකුව විසින් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මහ බැංකුව විසින්, කොමිෂන් සභාව වෙත දැන්වීමක් කර, මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඒ තැනැත්තාට නිකුත් කරන ලද බලපත්‍රය අත්හිටුවීමට, අහෝසි කිරීමට හෝ අවලංගු කිරීමට මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට නිර්දේශ කිරීම, මේ වගන්තියේ අන්තර්ගත කිසිවක් මගින් සීමා කිරීම හෝ වැළැක්වීම සිදු කරනු නොලැබිය යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම**

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

**“බලපත්‍රයක් අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම**

**43.** (1) මේ කොටස ප්‍රකාරව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට නිකුත් කරන ලද බලපත්‍රයක්, මහ බැංකුවේ නිර්දේශය මත මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අත්හිටුවීම, අහෝසි කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ බලපත්‍රයක් අත්හිටුවීමට, අහෝසි කිරීමට හෝ අවලංගු කිරීමට පෙරාතුව, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් බලපත්‍රලාභියාට නිදහසට කරුණු කියා සිටීම සඳහා අවස්ථාවක් ලබා දිය යුතු ය.

(2) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින්, බලපත්‍රයක් අත්හිටුවීමට, අහෝසි කිරීමට හෝ අවලංගු කිරීමට තීරණයක් ගැනීමට පෙරාතුව ස්වකීය මතය අනුව විමසා බැලීම අවශ්‍ය වන වෙනත් කාරණා සම්බන්ධයෙන් මහ බැංකුවෙන්, කොමිෂන් සභාවෙන් හෝ වෙනත් තැනැත්තකුගෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි ය. ඒ තීරණය බලපත්‍රලාභියා, මහ බැංකුව සහ කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ඉවත් කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලැබිය හැකි ව්‍යාපාරවල ස්වභාවය

**46.** (1) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් පහත දැක්වෙන ව්‍යාපාරවලින් කවර හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබිය හැකි ය:-

(අ) යම් නිර්වාසික තැනැත්තකුගෙන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු භාර ගැනීම;

(ආ) යම් නිර්වාසික තැනැත්තකුගෙන් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම;

(ඇ) යම් නිර්වාසික තැනැත්තකුට යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් මූල්‍ය පහසුකමක් ලබා දීම;

(ඇ) වෙනත් යම් අක්වෙරළ ඒකකයක් සමඟ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් ගනුදෙනුවක නිරත වීම;

(ඉ) නිර්වාසික තැනැත්තකු සමඟ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම;

(ඊ) මේ පනත යටතේ අදහස් කරනු ලබන පරිදි, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම; හෝ

(උ) මහ බැංකුවේ එකඟත්වය ඇතිව යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන වෙනත් යම් ගනුදෙනුවක නිරත වීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින් මහ බැංකුවේ පූර්ව ලිඛිත අනුමතයට යටත්ව, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් යම් බලයලත් තැනැත්තකුගෙන් හෝ වාසික තැනැත්තකුගෙන් ඉතිරි කිරීමේ තැන්පතු, කාලීන තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු භාර ගැනීම හෝ යම් බලයලත් තැනැත්තකුට හෝ වාසික තැනැත්තකුට මුදල් ණයට දීම සිදු කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ඒ අනුමතය ප්‍රදානය කිරීමේ දී, ඒ අදාළ ගනුදෙනුව-

(අ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ දේශීය මිල ස්ථායීතාවය අත්කර ගැනීමේ හා පවත්වාගෙන යාමේ සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය සුරක්ෂිත කිරීමේ මහ බැංකුවේ අරමුණුවලට; සහ

(ආ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ නිල ජාත්‍යන්තර සංචිතවල විචක්ෂණශීලී හා ඵලදායී කළමනාකරණය ඵලදායී ලෙස සිදු කිරීමට,

අගතිදායක නොවන බවට මහ බැංකුව විසින් සෑහීමට පත්විය යුතු ය:

එසේම තවදුරටත්, මේ උපවගන්තිය යටතේ වූ අනුමතය, මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව සහ නිශ්චිත වාසික තැනැත්තන්ගේ පංතියකට හෝ පංතිවලට හෝ නිශ්චිත ගනුදෙනුවලට ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ වෙනත් විධිවිධානවලට අගතියක් නොමැතිව, මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් නියමවලට හා කොන්දේසිවලට යටත්ව, බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවලින් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ණය ලබාගත හැකි ය.

(4) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා

විසින්, ස්වකීය මෙහෙයුම්වලට අදාළ වියදම් සිදු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පොළී නොදරන රුපියල් ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම මේ වගන්තියේ අන්තර්ගත කිසිවක් මගින් වළක්වනු නොලැබිය යුතු අතර, ඒ ගිණුම වෙත සිදු කරන බැරකිරීම් ශ්‍රී ලංකාව තුළට ප්‍රේෂණය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම හරහා සිදු කරන බැර කිරීම් විය යුතු ය.”.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරිම

“ගිණුම් විගණනය කිරිම

**48.** (1) මහ බැංකුව විසින්-

(අ) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තාගේ ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරුන්ගේ ලැයිස්තුවක්, විධානයක් මගින් නිකුත් කරනු ලැබිය යුතු ය;

(ආ) ඒ විගණකවරුන් අතරින් විගණකවරයකු පත්කිරීම සඳහා ඒ තැනැත්තාට කටයුතු සලස්වනු ලැබිය යුතු ය;

(ඇ) ඒ විගණකවරයාගේ වාර්තාව මහ බැංකුව විසින් සමාලෝචනය කිරීම පිණිස මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් සහ කාලසීමාවලින් ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය; සහ

(ඈ) මහ බැංකුවේ මතය අනුව, (ඇ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද විගණන වාර්තාව ප්‍රමාණවත් නොවන්නේ නම්, විගණනයේ විෂය පථය සීමා සහිත නම් හෝ මහ බැංකුව විසින් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් හේතුවක් මත, අවශ්‍ය විය හැකි පරිදි, ඒ විගණකවරයා ම හෝ ලැයිස්තුවේ සිටින වෙනත් විගණකවරයකු මගින් වැඩිදුර විගණන සිදු කිරීම සඳහා නියම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ සිදු කරනු ලබන යම් විගණනයක් ආශ්‍රිත සියලු වියදම් ඒ තැනැත්තා විසින් දරනු ලැබිය යුතු ය.

(2) මේ කොටස යටතේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් විගණන වාර්තාව මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ දී ම, ඒ විගණන වාර්තාවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය ඉවත් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 51අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 51අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

“බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවලට මේ කොටස අදාළ නොවිය යුතු බව

**51අ.** බැංකු පනත යටතේ මහ බැංකුවේ අනුමතය සහිතව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ස්වකීය මෙහෙයුම් කටයුතු සිදු කරන, බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවලට මේ කොටසේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, “ව්‍යාපාර හඳුනා ගනු ලැබිය හැකි ය.” යන වචන වෙනුවට “ව්‍යාපාර, නියම කරනු ලැබිය හැකි නිර්ණායකවලට අනුව හඳුනාගනු ලැබිය හැකි ය.” යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

“(3අ) (3) වන උපවගන්තියේ සඳහන් බදු හා සම්බන්ධ නිදහස් කිරීම් ප්‍රදානය කිරීම, කොමිෂන් සභාව විසින් සපයනු ලබන අදාළ තාක්ෂණික දත්ත මත, මුදල් අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන තාක්ෂණික විශ්ලේෂණයකට යටත් විය යුතු ය. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල පවත්නා කාර්යසාධනය නිශ්චිත ඉලක්කවලට අනුව අධීක්ෂණය කිරීම කොමිෂන් සභාවේ වගකීම විය යුතු ය.”;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

“(5) අවම ආයෝජනය සහ කාණ්ඩ, අවම රැකියා නිර්මාණය සහ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5අ) මුදල් අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව විමසා, සෑම අවුරුදු පහකට වරක් ම, මේ පනත යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවලට අදාළ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් සමාලෝචනය කරනු ලැබිය හැකි ය.''; සහ

(4) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(7) මේ වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කරනු ලබන ඒ නිදහස් කිරීම්වල හෝ දිරිගැන්වීම්වල වලංගු කාලසීමාව නියම කරනු ලබන පරිදි විය යුතු ය.''.

*ප්‍රධාන ප්‍රඥප්තියට 52අ, 52ආ, 52ඇ, 52ඈ සහ 52ඉ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම*

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 52අ, 52ආ, 52ඇ, 52ඈ සහ 52ඉ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

*''ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල පසු අධීක්ෂණය*

**52අ.** (1) කොමිෂන් සභාව විසින්, යම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි, කලින් කල, මූලික කාර්යසාධන දර්ශක පිළිබඳ පසු අධීක්ෂණය තක්සේරු කර, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල ප්‍රතිඵල සහ මූල්‍ය බලපෑම් එහි නිල වෙබ් අඩවියෙහි පළ කිරීම මගින් මහජනතාව වෙත හෙළිදරව් කරනු ලැබිය යුතු ය.

(2) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල යම් බලයලත් තැනැත්තකු අනුමත මූලික කාර්යසාධන දර්ශකවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී කොමිෂන් සභාව විසින්, ඒ බලයලත් තැනැත්තා වෙත අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳ දැන්වීමක් නිකුත් කළ යුතු අතර, ඒ දැන්වීමෙහි-

(අ) අනුකූලව කටයුතු නොකිරීමේ ස්වභාවය;

(ආ) නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන නිශ්චිත කාල රාමුවක්;

(ඇ) වහාම අනුකූලව කටයුතු කරන ලෙස නියම කෙරෙන විධානයක් සහ අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් ප්‍රතිකර්මීය හෝ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කිරීමක්; සහ

(ඈ) උචිත අවස්ථාවල දී, අනුකූලව කටයුතු කිරීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීමට නියම කිරීමක්,

ඇතුළත් විය යුතු ය.

(3) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල යම් බලයලත් තැනැත්තකු කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වන ලද කාලය ඇතුළත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, අනුකූලව කටයුතු නොකිරීමේ ස්වභාවය සහ බරපතළකම පිළිබඳව සැලකිල්ල යොමු කරමින්, පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය:-

(අ) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සම්බන්ධයෙන් මේ පනත යටතේ ප්‍රදානය කරනු ලැබ ඇති යම් හෝ සියලු නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සීමා කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම; හෝ

(ආ) ඒ සම්බන්ධයෙන් දරන ලද පාඩුව අය කර ගැනීම සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම.

හේතු දැක්වීම සඳහා වන දැන්වීම

**52ආ.** (1) කොමිෂන් සභාව විසින්, 52අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාමාර්ගය ගැනීමට පෙරාතුව, එම ක්‍රියාමාර්ගය ගැනීම සඳහා වන හේතු නිශ්චිතව දක්වමින් ලිඛිත දැන්වීමක් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල බලයලත් තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන දැන්වීමක් මගින්, ඒ දැන්වීම ලැබීමේ දිනයේ සිට මාස එකක කාලසීමාවක් ඇතුළත, 52අ වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු නොවන්නේ මන්ද යන්නට හේතු දක්වන ලෙස ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල බලයලත් තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු ය.

(3) අවසාන තීරණයක් ගනු ලැබීමට පෙරාතුව, පෞද්ගලිකව ම හෝ බලයලත් අනුයෝජිතයකු හරහා කරුණු කියා සිටීම සඳහා ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල බලයලත් තැනැත්තා වෙත සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු ය.

(4) ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවල බලයලත් තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් කරන ලද යම් කරුණු ඉදිරිපත් කිරීම් සලකා බැලීමෙන් පසුව, කොමිෂන් සභාව විසින්, ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු හේතු මත, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සම්බන්ධයෙන් මේ පනත යටතේ ප්‍රදානය කරනු ලැබ ඇති යම් හෝ සියලු නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සීමා කිරීම, අත්හිටුවීම හෝ අහෝසි කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

බදු වාර්තා ගොනු කිරීම

**52ඇ.** සෑම බලයලත් තැනැත්තකු විසින් ම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව බදු වාර්තා ගොනු කරනු ලැබිය යුතු ය.

ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා වන බදු වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාව

**52ඇ.** මුදල් අමාත්‍යාංශය විසින්, එක් එක් මුදල් වර්ෂයට අදාළව, මේ පනත යටතේ වන සියලුම ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවලට අදාළ බදු වියදම් පිළිබඳ වාර්ෂික වාර්තාවක් ස්වකීය නිල වෙබ් අඩවියෙහි පළකරනු ලැබිය යුතු ය.

සමාලෝචනය

**52ඉ.** අවුරුදු පහක් ඉකුත් වීමෙන් පසුව, මුදල් අමාත්‍යාංශය විසින්, කොමිෂන් සභාව විමසා, මේ පනත යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරවලට අදාළ වන බදු විරාම කාල සීමාව, සහ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් සමාලෝචනය කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

“(ඇ) ඒ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ආරම්භ කිරීමට යෝජිත දිනය සහ ඒ නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් නියම කරනු ලබන පරිදි අවසන් විය යුතු දිනය;”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ච) ඡේදය ඉවත් කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ (ජ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්: -

“(ජ) අවම ආයෝජනය සහ කාණ්ඩය, අවම රැකියා නිර්මාණය, සහ නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් නියම කිරීම;”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ; " ; සහ

(2) "රජයේ අලෙවි කළ හැකි ඉඩම්" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "ජාත්‍යන්තර ප්‍රමිති" යන්නෙන්, බොහෝ රටවලට අයත් විශේෂඥයන්ගේ ඒකමතිකභාවයෙන් වැඩි දියුණු කරන ලද සහ බැංකු අධීක්ෂණය කිරීම පිළිබඳ බාසල් කමිටුව සහ මූල්‍ය ස්ථායීතා මණ්ඩලය ඇතුළත්ව ගෝලීය වශයෙන් පිළිගත් ආයතනයක් විසින් පළකරන ලද මූලධර්මවලින් මාර්ගෝපදේශවලින්, ක්‍රියාවලීන් ගෙන් හෝ ගතිලක්ෂණවලින් සමන්විත ප්‍රමිති අදහස් වේ; " .

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**18.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.